# තිලකුණු දැකීම / අනුලෝම ක්ෂාන්තිය හා සම්මත්ත නියාමය

## විදර්ශනාව තුළින් සසරෙන් වෙන්වීම සහ නිවනට පත්වීම

සබ්බසුත්තං

සබ්බං වො, භික්ඛවෙ, දෙසෙස්සාමි. තං සුණාථ. කිඤ්ච, භික්ඛවෙ, සබ්බං? චක්ඛුඤ්චෙව රූපා ච, සොතඤ්ච සද්දා ච, ඝානඤ්ච ගන්ධා ච, ජිව්හා ච රසා ච, කායො ච ඵොට්ඨබ්බා ච, මනො ච ධම්මා ච - ඉදං වුච්චති, භික්ඛවෙ, සබ්බං.

ඇසද රූපයෝද, කණද ශබ්දයෝද, නාසයද ගන්‍ධයෝද, දිවද රසයෝද, කයද ස්පර්‍ශයෝද, මනසද ධර්‍මයෝද, මහණෙනි, මේ සියල්ල යයි කියනු ලැබේ.

### සබ්බං භික්ඛවෙ, අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා.

මහණෙනි, සියල්ල නිශ්චිත පැවැත්මකින් තොර විපරිණාමීය ස්වභාවයෙන් යුක්ත වූද, හේතු ප්‍රත්‍යයන් (සංයෝජන) විසින් සකස් කරන ලද්දා වූද, හේතුඵල වශයෙන් තාවකාලිකව හටගෙන සකස් වී විද්‍යමාන වන්නා වූද, ක්‍ෂයවන විනාශකාරි ස්වභාව ඇත්තාවූද, දුක්ඛස්කන්ධය උදා කරන්නා වූද, අවසන් වන - අවසන් කළ යුතු (වය කළ යුතු ) ස්වභාව ඇත්තාවූද, ගිලිහී යන වෙන් වී යන - නොඇලිය යුතු අත්හළ යුතු ස්වභාව ඇත්තාවූද, නියාම ධර්ම හේතුවෙන් ඒ ඒ මොහොතේදී තාවකාලිකව නිරෝධ වන - එසේද වුව ප්‍රඥාවෙන් අනුප්පාද වශයෙන් සදාතනික වශයෙන්ම නිරෝධ කළයුතු නැවත නූපදවිය යුතු ස්වභාව ඇත්තාවූද ධර්මයෝ වෙත්.

සබ්බං භික්ඛවෙ, අනිච්චං. යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා’ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

මහණෙනි, සියල්ල අනිච්චයි.  යමක් අනිච්ච නම් එය දුකයි. යමක් දුක නම් එය අනත්තයි (අසාරයි). යමක් අනත්ත නම් (අසාර නම්) එය මාගේ නොවේ, ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ යැයි, එහි යථාර්ථය නුවණින් දැකිය යුතුයි.

**ඛයට්ඨේන අනිච්චං -** නිරන්තරයෙන් ක්ෂය වන්නා වූද / විපරිණාමය වන්නා වූද / විනාශ වන්නා වූද / එබැවින් විනාශයක්ම අත් කර දෙන්නා වූද අර්ථයෙන් "අනිච්ච" නම් වේ.

**භයට්ඨේන දුක්ඛං -** ඒ විපරිණාමීය ලක්ෂණය / විනාශකාරි ලක්ෂණය හේතුවෙන් නිරන්තරයෙන් පැවැත්ම ගැන භය උපදවන / භයක්ම අත් කර දෙන්නා වූ අර්ථයෙන් "දුක්ඛ" නම් වේ.

**අසාරකට්ඨේන අනත්තා -** යමක් අනිච්ච නම්, දුක නම්, විපරිණාමීය - විනාශකාරි ස්භාවයෙන් යුක්ත නම්, එහි මම - මගේ යනුවෙන් ගත යුතු - ගත හැකි ආත්මීය සාරයෙන් යුත් කිසිවක් නොමැත යන ශූන්‍ය අර්ථයෙන් "අනත්ත" නම් වේ.

## ආස්සාද - ආදීනව - නිස්සරණ

යං ඛො පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං අස්සාදො.

**යමක් හේතුවෙන් සැපක්, සොම්නසක් උපදීද, මේ ආශ්වාදයයි.**

යො ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං නිස්සරණං.

**එහි ඡන්දරාගය දුරුකිරීමක්, ඡන්ද රාගය පහකිරීමක් වේද, මෙය නිස්සරණයයි.**

යං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අයං ආදීනවො.

**යමක් අනිච්චද, දුකද, විපරිණාම ස්වභාවය ඇත්තේද, මේ ආදීනවයයි.**

# විදර්ශනා කළ යුත්තේ කුමක්ද ? (තිලකුණු අනුපස්සනාව)

නිස්සරණය හෙවත් සියල්ලෙන් නිදහස්වීම උදෙසා, ආස්වාදය ද (සෝමනස්ස සහගත සැප වේදනාව), ඒ ආස්වාදයට ප්‍රත්‍ය වන සියල්ල ද අනිච්ච, දුක්ඛ, අනත්ත ත්‍රිලක්ෂණයට අනුව අනුපස්සනා කළ යුතු ය.

## සියල්ල ස්කන්ධ වශයෙන්

**රූපූපාදානක්ඛන්ධය**

**වෙදනූපාදානක්ඛන්ධය**

**සඤ්ඤූපාදානක්ඛන්ධය**

**සඞ්ඛාරූපාදානක්ඛන්ධය**

**විඤ්ඤාණූපාදානක්ඛන්ධය**

## සියල්ල ආයතන වශයෙන් (අජ්ඣත්ත - බාහිර)

**ඇස - රූප**

**කණ - ශබ්ද**

**නාසය - ගන්ධ**

**දිව - රස**

**කය - ස්පර්ශ**

**මන - ධම්ම**

<u>සියල්ල ධාතු වශයෙන්</u>

**පඨවි ධාතුව (තද - දැඩි ස්වභාවය)**

**ආපෝ ධාතුව (වැගිරෙන ස්වභාවය)**

**වායෝ ධාතුව (විසිරෙන ස්වභාවය)**

**තේජෝ ධාතුව (දිස්වන ස්වභාවය)**

**ආකාශ ධාතුව (ඉඩක් ගන්නා වූ ස්වභාවය)**

**විඤ්ඤාණ ධාතුව (දැනීම් - දැනෙන - දැනගන්නා ස්වභාවය)**

<u>සියල්ල පටිච්ච සමුප්පන්න ධර්ම (හේතුඵල ධර්ම) වශයෙන්</u>

**අවිජ්ජා**

**සංඛාර**

**විඤ්ඤාණ**

**නාම රූප**

**සළායතන**

**ඵස්ස**

**වේදනා**

**තණ්හා**

උපාදාන

භව

ජාති

ජරා - මරණ - ශෝක - පරිදේව - දුක්ඛ - දෝමනස්ස - උපායාස

<u>සියල්ල සියලු ආකාරයෙන් (තිස්පොළ විදර්ශනා කිරීම)</u>

ඇස (චක්ඛු) - රූපය - චක්ඛු විඤ්ඤාණය - චක්ඛු සම්ඵස්සය - චක්ඛු සම්ඵස්සජා වේදනා (ඇසෙහි ආස්වාදය)

කණ (සෝත) - ශබ්දය - සෝත විඤ්ඤාණය - සෝත සම්ඵස්සය - සෝත සම්ඵස්සජා වේදනා (කණෙහි ආස්වාදය)

නාසය (ඝාන) - ගන්ධය - ඝාන විඤ්ඤාණය - ඝාන සම්ඵස්සය - ඝාන සම්ඵස්සජා වේදනා (නාසයෙහි ආස්වාදය)

දිව (ජිව්හා) - රසය - ජිව්හා විඤ්ඤාණය - ජිව්හා සම්ඵස්සය - ජිව්හා සම්ඵස්සජා වේදනා (දිවෙහි ආස්වාදය)

කය (කාය) - ඵොට්ඨබ්බය - කාය විඤ්ඤාණය - කාය සම්ඵස්සය - කාය සම්ඵස්සජා වේදනා (කයෙහි ආස්වාදය)

මන (මනො) - ධම්ම - මනො විඤ්ඤාණය - මනො සම්ඵස්සය - මනො සම්ඵස්සජා වේදනා (මනෙහි ආස්වාදය)

## ඛුද්දකනිකාය / පටිසම්භිදාමග්ගපාළි / පඤ්ඤාවග්ගො / විපස්සනා කථා

**මූලික ත්‍රිලක්ෂණය අනු ලක්ෂණ 40 ක් වශයෙන් විස්තාරණ ක්‍රමයට නුවණින් දැකීම සම සතලිස් විදර්ශනා කර්මස්ථාන නම් වේ. ආස්වාදය සහ ආස්වාදයට ප්‍රත්‍ය වන සියල්ල මෙම ලක්ෂණ 40 ට අනුකූලව නුවණින් විමසා බැලීම තුළින් සියල්ල කෙරෙහි ඇති ඡන්දරාගය දුරු වී යයි. සිත නිස්සරණයට පත් වෙයි. නිවන පූර්ණ වෙයි.**

### අනිච්චානුපස්සනා

**අනිච්චතොති -** නිශ්චිත පැවැත්මක් - පැණවීමක් නොමැති ස්වභාවය / හේතූන් නිසා හට ගෙන හේතු නිරෝධයෙන් පැවැත්ම අවසන් වන ලක්ෂණය

**පලොකතොති -** පළුදු වන / විනාශවන / විනාශකාරි ලක්ෂණය

**චලතොති -** සැලෙන / චංචල වන / කම්පාවන / කම්පා කරවන ලක්ෂණය

**පභංගුතොති -** බිඳෙනසුලු / කැඩී බිඳී යන / කඩා බිඳ දමන ලක්ෂණය

**අද්ධුවතොති -** ස්ථිර වශයෙන් - නිත්‍ය වශයෙන් නොපවතින ලක්ෂණය

**විපරිණාමධම්මතොති -** වෙනස්වෙමින් අන්‍යභාවයන්ට පත්ව විනාශය කරා ගමන් කරන ලක්ෂණය

**විභවතොති -** අභාවයට පත්වන / අභාවයට පත් කරන ලක්ෂණය

**සඞ්ඛතතොති -** පෙර නොතිබීම, සංයෝජන හේතුවෙන් සකස් වූ / සකස්වන / සකස් කරන ලක්ෂණය

**මරණධම්මතොති -** මරණයෙන් කෙළවර වන / කෙළවර කරන ලක්ෂණය

<u>දුක්ඛානුපස්සනා</u>

**දුක්ඛතොති -** සිත දූෂ්‍ය කරන අසහනකාරි ලක්ෂණය

**රොගතොති -** රෝගයක් බඳු නිරන්තර පීඩාවන් ඇති කරන ලක්ෂණය

**ගණ්ඩතොති -** ගෙඩියක් /පිළිකාවක් බඳු පෙළීම් ඇති කරන ලක්ෂණය

**අඝතොති -** පාපයක් / විපතක් බඳු අවැඩක්ම සලසන ලක්ෂණය

**සල්ලතොති -** ආයුධයක් / හුලක් බඳු තියුණු දුක් වේදනා ගෙන දෙන ලක්ෂණය

**අතාණතොති -** ආරක්ෂාව අහිමි වී යාම බඳු ලක්ෂණය

**අලෙණතොති -** අනාරක්ෂිත ස්ථානයක වාසය කිරීම බඳු ලක්ෂණය

**අසරණතොති -** පිහිට / පිළිසරණ අහිමි කරන ලක්ෂණය

**ආබාධතොති -** ආබාධයක් බඳු අපහසුතා ඇති කරන ලක්ෂණය

**ඊතිතොති -** දුක් විපත්ති උරුම කරදෙන ලක්ෂණය

**අඝමූලතොති -** පාපයට / විපතට / දුකට / ගැටුමට හේතු සකස් කරන ලක්ෂණය

**වධකතොති -** වධ / හිරිහැර ගෙනදෙන ලක්ෂණය

**මාරාමිසතොති -** මාරයාටම ගොදුරු වන / මාරයාගේ ආහාරය බඳු ලක්ෂණය

**ජාතිධම්මතොති -** නැවත නැවත උපත සකස් කරන ලක්ෂණය

**සාසවතොති -** ආශ්‍රව / ආශාවන් / කෙළෙස් වඩවන ලක්ෂණය

**ආදීනවතොති -** දෝෂ / විපත් / ප්‍රශ්න / කරදර උරුම කරදෙන ලක්ෂණය

**ජරාධම්මතොති -** ජරාව / දිරා යාම / දුර්වලභාවය හිමි කරදෙන ලක්ෂණය

**බ්‍යාධිධම්මතොති -** ව්‍යාධියට / වැනසීමට නැඹුරු වී සිටින ලක්ෂණය

**උපද්දවතොති -** උවදුරු / උපද්‍රව උරුම කර දෙන ලක්ෂණය

**භයතොති -** භය ගෙන දෙන / භය ඇති කරන ලක්ෂණය

**උපසග්ගතොති -** බාධා / අවහිරතා ඇති කරන ලක්ෂණය

**සොකධම්මතොති -** ශොකය ගෙන දෙන ලක්ෂණය

**පරිදෙවධම්මතොති -** හැඬීම / වැළපීම උරුම කර දෙන ලක්ෂණය

**උපායාසධම්මතොති -** බලවත් සිත් තැවුල් / බලවත් වෙහෙස ඇති කරන ලක්ෂණය

**සංකිලෙසිකධම්මතොති -** සිත කිළුටු කරන / සිත අපවිත්‍ර කරන ලක්ෂණය

## <u>අනත්තානුපස්සනා</u>

**පරතොති -** ස්වකීය නොවූ / තමන්ට අයත් නොවූවක් බඳු (මාරයාට අයිති) ලක්ෂණය

**රිත්තතොති -** ගතයුත්තක් නැති / හිස් වූ ලක්ෂණය

**තුච්ඡතොති -** නිෂ්ඵල වූ / හරයක් නොමැති / පහත් ලාමක වූ ලක්ෂණය

**සුඤ්ඤතොති -** ඒකීය අවිපරිණාමීය ආත්මයෙන් ශූන්‍ය වූ ලක්ෂණය

**අනත්තතොති -** ආත්මීය වශයෙන් කිසිවක් අත්පත් කර ගත නොහැකි ලක්ෂණය

**අසාරකතොති -** ආත්මීය වශයෙන් අත්පත් කර ගැනීමට සුදුසු කිසිවක් නොමැති නිසරු ලක්ෂණය

# අනුලෝම ක්ෂාන්ති 40 සහ සම්මත්ත නියාම 40

සො වත, භික්ඛවෙ, භික්ඛු කඤ්චි සඞ්ඛාරං නිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - නෙතං ඨානං විජ්ජති.

මහණෙනි, යම් භික්ෂුවක් කිසියම් සංස්කාරයක් නිච්ච වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව ලොව්තුරු මගට අනුලොමවූ විදසුන් නැණින් යුතු වන්නේය, යන මේ කාරණය සිදු නොවන්නකි. අනුලොම විදසුන් නැණින් යුක්ත නොවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය, යථා ස්වභාවය පිළිබඳ නිශ්චයට පැමිණෙන්නේය යන මේ කරුණ සිදුනොවන්නකි. සම්මත්ත නියාමයට බැස නොගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය නොසිදුවන්නකි.

සො වත, භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරෙ අනිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - ඨානමෙතං විජ්ජති.

මහණෙනි, යම් භික්ෂුවක් සියලු සංස්කාර අනිච්ච වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව අනුලොම නුවණින් යුක්තවූයේ වන්නේය යන මේ කාරණය සිදුවන්නකි. අනුලොම නුවණින් යුක්තවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය යන මේ කරුණු සිදුවන්නකි. සම්මත්ත නියාමයට බැසගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මෙය සිදුවන්නකි.

සො වත, භික්ඛවෙ, භික්ඛු කඤ්චි සඞ්ඛාරං සුඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - නෙතං ඨානං විජ්ජති .

මහණෙනි, යම් භික්ෂුවක් කිසියම් සංස්කාරයක් සුඛ වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව ලොව්තුරු මගට අනුලොමවූ විදසුන් නැණින් යුතු වන්නේය, යන මේ කාරණය සිදු නොවන්නකි. අනුලොම විදසුන් නැණින් යුක්ත නොවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය, යථා ස්වභාවය පිළිබඳ නිශ්චයට පැමිණෙන්නේය යන මේ කරුණ සිදුනොවන්නකි. සම්මත්ත නියාමයට බැස නොගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය නොසිදුවන්නකි.

සො වත, භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරෙ දුක්ඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - ඨානමෙතං විජ්ජති.

මහණෙනි, යම් භික්ෂුවක් සියලු සංස්කාර දුක්ඛ වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව අනුලොම නුවණින් යුක්තවූයේ වන්නේය යන මේ කාරණය සිදුවන්නකි. අනුලොම නුවණින් යුක්තවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය යන මේ කරුණු සිදුවන්නකි. සම්මත්ත නියාමයට බැසගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මෙය සිදුවන්නකි.

සො වත, භික්ඛවෙ, භික්ඛු කඤ්චි ධම්මානං අත්තතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - නෙතං ඨානං විජ්ජති .

මහණෙනි, යම් භික්ෂුවක් කිසියම් හේතුඵල ධර්මයක් අත්ත (සාර) වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව ලොව්තුරු මගට අනුලොමවූ විදසුන් නැණින් යුතු වන්නේය, යන මේ කාරණය සිදු නොවන්නකි. අනුලොම විදසුන් නැණින් යුක්ත නොවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය, යථා ස්වභාවය පිළිබඳ නිශ්චයට පැමිණෙන්නේය යන මේ කරුණ සිදුනොවන්නකි. සම්මත්ත නියාමයට බැස නොගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය නොසිදුවන්නකි.

සො වත, භික්ඛවෙ, භික්ඛු සබ්බධම්මෙ අනත්තතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - ඨානමෙතං විජ්ජති.

මහණෙනි, යම් භික්ෂුවක් සියලු හේතුඵල ධර්මයන් අනත්ත වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව අනුලොම නුවණින් යුක්තවූයේ වන්නේය යන මේ කාරණය සිදුවන්නකි. අනුලොම නුවණින් යුක්තවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය යන මේ කරුණ සිදුවන්නකි. සම්මත්ත නියාමයට බැසගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මෙය සිදුවන්නකි.

සො වත, භික්ඛවෙ, භික්ඛු නිබ්බානං දුක්ඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - නෙතං ඨානං විජ්ජති. ,

මහණෙනි, යම් භික්ෂුවක් නිවන දුක්ඛ වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව ලොව්තුරු මගට අනුලොම වූ විදසුන් නැණින් යුතු වන්නේය, යන මේ කාරණය සිදු නොවන්නකි. අනුලොම විදසුන් නැණින් යුක්ත නොවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය, යථා ස්වභාවය පිළිබඳ නිශ්චයට පැමිණෙන්නේය යන මේ කරුණ සිදුනොවන්නකි. සම්මත්ත නියාමයට බැස නොගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය නොසිදුවන්නකි.

සො වත, භික්ඛවෙ, භික්ඛු නිබ්බානං සුඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති - ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති - ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති - ඨානමෙතං විජ්ජති.

මහණෙනි, යම් භික්ෂුවක් නිවන සුඛ වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව අනුලොම නුවණින් යුක්තවූයේ වන්නේය යන මේ කාරණය සිදුවන්නකි. අනුලොම නුවණින් යුක්තවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය යන මේ කරුණ සිදුවන්නකි. සම්මත්ත නියාමයට බැසගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මෙය සිදුවන්නකි.

කතිහාකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති, කතිහාකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති? චත්තාරීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති, චත්තාරීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති.

කී විධියකින් අනුලොම නුවණ ලබයිද? කීවිධියකින් සම්මත්ත නියාමයට බැසගනීද? සතළිස් ආකාරයකින් අනුලොම නුවණ ලබයි. සතළිස් ආකාරයකින් සම්මත්ත නියාමයට බැසගනියි.

**කතමෙහි චත්තාරීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති, කතමහි චත්තාරීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති ?**

**කවර සතළිස් ආකාරයකින් අනුලොම ක්ෂාන්තිය ලබයිද? කවර සතළිස් ආකාරයකින් සම්මත්ත නියාමයට බැසගනීද ?**

| අනුලෝම ක්ෂාන්තිය / සසර ගැන කලකිරීම | සම්මත්ත නියාමය / නිවන් මඟට පැමිණීම |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ අනිච්චතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අනිච්ච / අනිසි / අනිස වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිච්චං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය නිච්ච වූ නිසි වූ නිස වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ දුක්ඛතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය දුක වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො සුඛං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරොධය සුඛ වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ රොගතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය රෝගය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො ආරොග්‍යං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය ආරෝග්‍ය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ ගණ්ඩතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය පිළිකාව / ගෙඩිය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අගණ්ඩං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය ගණ්ඩ රහිත වූ නිර්වාණය යැයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ සල්ලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය උල වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො විසල්ලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය උල් රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ අඝතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය විපත වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනඝො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය විපත් රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ ආබාධතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය ආබාධය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාබාධො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය ආබාධ රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ පරතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අන් සතු වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපරප්පච්චයං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය අන් සතු නො වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ පලොකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය පලුද්ද වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපලොකධම්මො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය පලුදු රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ ඊතිතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය විපත්තිය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනීතිකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය විපත්ති රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ උපද්දවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය උවදුර වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපද්දවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය උවදුරු රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ භයතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය භය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අභයං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය නිර්භය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ උපසග්ගතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය බාධාව / අවහිරය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපසග්ගං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය බාධා රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ චලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය කම්පාව / චලනය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අචලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය අචල වූ අකම්ප්‍ය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ පභඞ්ගුතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය බිඳීම වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපභඞ්ගු නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය නොබිඳීම වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ අද්ධුවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අස්ථිර වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො ධුවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය සදාතනික වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ අතාණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අනාරක්ෂාව වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො තාණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය ආරක්ෂාව වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ අලෙණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අනාරක්ෂිත ස්ථානය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො ලෙණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය ආරක්ෂිත ස්ථානය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ අසරණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය පිහිටක් නොමැත්ත වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො සරණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය පිහිට ඇත්තා වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ රිත්තතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය හිස් බව වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අරිත්තං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය නොසිස් වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ තුච්ඡතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය ලාමක වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අතුච්ඡං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය අලාමක වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ සුඤ්ඤතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය ශුන්‍යතාව වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමසුඤ්ඤං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය සියලු දුකින් තොර පරම ශුන්‍යතාව වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ අනත්තතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අනත්ත / අනර්ථය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමත්ථං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය උසස්ම අර්ථය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ ආදීනවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය දෝෂය වශයෙන් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාදීනවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය දෝෂ රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ විපරිණාමධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය විනාශ වෙමින් අවසානය කර ළංවීම වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවිපරිණාමධම්මං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය විනාශ නොවන්නා වූ අවසන් නොවන්නා වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ අසාරකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අසාරත්වය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො සාරං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය සාරත්වය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ අසමූලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය විපතෙහි මූලය මග වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනසමූලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය විපත් රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ වධකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය වධය / කරදරය වශයෙන් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවධකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය වධයෙන් තොර වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ විභවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය අභාවය වශයෙන් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවිභවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය අභාවයක් නොමැත්තා වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ සාසවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය ආශ්‍රව / ක්ලේෂ වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාසවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරොධය ආශ්‍රව රහිත වූ / නික්ලේෂ වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ සඞ්ඛතතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය හේතු ප්‍රත්‍යයෙන් සකස් වුවක් වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසඞ්ඛතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය හේතුන්ගෙන් සකස් නොවූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ මාරාමිසතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය මාරයාගේ ආහාරය වශයෙන් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිරාමිසං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය නිරාමිස වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ ජාතිධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය ඉපදීම / හට ගැනීම වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජාතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය නොඉපදීම වූ / හට නොගැනීම වූ නිර්වාණය යැයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ ජරාධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය දිරීම / ජරාව වශයෙන් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජරං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය දිරීම් නැති / අජර වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ බ්‍යාධිධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය රෝගය / ව්‍යාධිය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අබ්‍යාධි නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය රෝග / ව්‍යාධි රහිත වූ නිර්වාණය යැයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ මරණධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය මරණය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අමතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය අමරණීය වූ / අමෘතය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ සොකධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය ශෝකය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසොකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය ශෝක රහිත වූ / අශෝකය වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ පරිදෙවධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය පරිදේවය / වැළපීම වශයෙන් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපරිදෙවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය පරිදේව රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ උපායාසධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය බලවත් වෙහෙස / බලවත් ශෝකය වශයෙන් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපායාසං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය වෙහෙස රහිත වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |
| පඤ්චක්ඛන්ධෙ සංකිලෙසිකධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති.<br><br>පඤ්චස්කන්ධය කිළුට වශයෙන් නුවණින් බලන්නේ අනුලොම ක්ෂාන්තිය ලබයි. | පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසංකිලිට්ඨං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.<br><br>පඤ්චස්කන්ධයේ නිරෝධය පාරිශුද්ධ වූ නිර්වාණය යැයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි. |

ලාභා වො, භික්ඛවෙ, සුලද්ධං වො, භික්ඛවෙ,

ඛණො වො පටිලද්ධො බ්‍රහ්මචරියවාසාය.

මහණෙනි, නුඹලාට මහා ලාභයෙකි.

මහණෙනි, තොප විසින් මනාව ලැබූ යහපත් වූ ලාභයෙකි.

තොප විසින් බ්‍රහ්මචර්යාවෙහි විසීමට සුදුසු වූ ක්ෂණය ලබන ලද්දේය.

<u>සම්පාදනය – සුසිල හිමි</u>